**People's Insurance PLC,** No. 07, Havelock Road, P.O. Box 215, Colombo 05.
Tel: +94 11-2126 126 | Fax: +94 11-2126 109 | E-mail: pilassist@plc.lk | www.peoplesinsurance.lk
(A Subsidiary of People's Leasing & Finance PLC and People's Bank) - Company No. PB 3754 PQ



# ඉලෙක්ට්‍රොනික උපකරණ රක්ෂණ ඔප්පුව - රක්ෂණ සැලසුම් පිළිබඳ තොරතුරු ලේඛනය

**ඔප්පු වර්ගය:** ඉලෙක්ට්‍රොනික උපකරණ රක්ෂණ ඔප්පුව

**ලබා දෙනු ලබන මූලික ආවරණය:**

විශේෂයෙන් බැහැර කර ඇති හේතු හැර, වෙනත් ඕනෑම හේතුවක් නිසා භාණ්ඩයට හෝ එහි කොටසකට අනපේක්ෂිත හා හදිසි භෞතික අලාභයක් හෝ හානියක් සිදුවහොත් රක්ෂණ සමාගම විසින් රක්ෂිතයාට වන්දි ගෙවනු ඇත. රක්ෂිත අයිතම ක්‍රියාත්මක වෙමින් තිබිය දී හෝ ක්‍රියාත්මක නොවී තිබිය දී හෝ පිරිසිදු කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම ආදි කටයුතු සඳහා ගලවා තිබියදී හෝ පරිශ්‍රය තුල දී හෝ ඉහත සඳහන් මෙහෙයුම අතරතුර හෝ පසුව නැවත ඉදිකිරීම සඳහා වෙන තැනකට මාරු කිරීමේදී නමුත්, සාර්ථකව ක්‍රියාත්මක කිරීමෙන් පසුව පමණක් මෙම ඔප්පුව අදාළ වේ.

**ප්‍රධාන ලක්ෂණය(යන්):**

රක්ෂිත අයිතම ක්‍රියාත්මක වෙමින් පැවතිය ද හෝ නිශ්චලව තබා තිබුණ ද හෝ පිරිසිදු කිරීම ප්‍රතිසංස්කරණය කිරීම හේතුවෙන් ගලවා තිබුණ ද හෝ පරිශ්‍රය තුල මාරුකරමින් තිබුණ ද මෙම ඔප්පුව ක්‍රියාත්මක වේ. ආවරණය මෙම මෙහෙයුම් වලින් පසුව නැවත ඉදිකිරීම දක්වා ද දීර්ඝ කරනු ලබන නමුත් එය අදාළ වන්නේ සාර්ථකව ක්‍රියත්මක කිරීමෙන් පසුව පමණි.

*(මූලික ආවරණය පිළිබඳ වැඩි විස්තර සඳහා කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 01 බලන්න)*

**විධිවිධාන:**

- රක්ෂිත මුදල, භාණ්ඩ ප්‍රවාහනය, රේගු බදු සහ ස්ථාපිත කිරීමේ වියදම ඇතුළුව රක්ෂිත අයිතමයන් හි ප්‍රතිස්ථාපන පිරිවැයට සමාන විය යුතුය.
- රක්ෂිත මුදල අවශ්‍ය ප්‍රමාණයට වඩා අඩු නම්, ඕනෑම හිමිකම් පෑමක දී රක්ෂණ සමාගම් විසින් ගෙවනු ලබන්නේ, සමානුපාතික මුදලක් පමණි.
- රක්ෂිත මුදල නැවත ස්ථාපිත කර තිබුණහොත් මිස, අවිනිශ්චිත සිද්ධිය සිදුවූ දිනයේ දී ඉතිරිව ඇති රක්ෂිත කාලසීමාව සඳහා ගෙවා ඇති වන්දි මුදල් ප්‍රමාණයෙන් රක්ෂිත මුදල අඩු කෙරේ.

*(වැඩි විස්තර සඳහා කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 06 සහ 07 බලන්න)*

**ආවරණය නොවන දේ (පොදු ව්‍යතිරේක):**

- යුද්ධය, ආක්‍රමණය, විදෙස් සතුරු ක්‍රියා, සතුරුකම් හෝ යුද්ධයක් බඳු මෙහෙයුම්, සිවිල් යුද්ධය, කැරැල්ල, සිවිල් කැළඹීම්, ගෝත්‍රික නැගිටීම්, හමුදා කැරැල්ල, වැඩවර්ජන, කැරලි කෝලාහල, විප්ලවය, මිලිටරි හෝ බලය පැහැරනීම්, යුධ නීතිය හෝ වටලෑමේ තත්ත්වය.

- ඕනෑම රජයකට බලපෑම් කිරීමේ හෝ මහජනතාව බිය ගැන්වීමේ අරමුණ ඇතුළුව, දේශපාලනික, ආගමික, දෘෂ්ටිවාදාත්මක හෝ වාර්ගික අරමුණු සඳහා ඕනෑම පුද්ගලයකු හෝ කණ්ඩායමක් විසින් බලය හෝ ප්‍රචණ්ඩත්වය භාවිතා කිරීම හෝ තර්ජනය කිරීම ලෙස අර්ථ දක්වා ඇති ඕනෑම ත්‍රස්තවාදී ක්‍රියාවක්.

**People's Insurance PLC,** No. 07, Havelock Road, P.O. Box 215, Colombo 05.
Tel: +94 11-2126 126 | Fax: +94 11-2126 109 | E-mail: pilassist@plc.lk | www.peoplesinsurance.lk
(A Subsidiary of People's Leasing & Finance PLC and People's Bank) - Company No. PB 3754 PQ



- යුද්ධය හෝ ත්‍රස්තවාදය පාලනය කිරීම, වැළැක්වීම හෝ මර්දනය කිරීම සඳහා ගනු ලබන ඕනෑම ක්‍රියාමාර්ගයක් හේතුවෙන්, එහි ප්‍රතිඵලයක් ලෙස හෝ ඒ සම්බනධයෙන් සෘජුව හෝ වක්‍රව සිදුවන ඕනෑම ආකාරයක පාඩුවක්, හානියක්, පිරිවැයක් හෝ වියදමක්.
- රක්ෂිතයාගේ හෝ ඔවුන්ගේ නියෝජිතයන්ගේ හිතාමතා ක්‍රියා හෝ දැඩි නොසැලකිල්ල.
- සම්පූර්ණ හෝ අර්ධ වශයෙන් වැඩ නතර කිරීම.
- අ) ඕනෑම න්‍යෂ්ටික ඉන්ධනයකින් හෝ ඕනෑම න්‍යෂ්ටික ස්ථාපනයකින් ප්‍රතික්‍රියාකාරකයකින් හෝ වෙනත් න්‍යෂ්ටික එකලස් කිරීමකින් හෝ න්‍යෂ්ටික ඉන්ධනයකින් ඇතිවන විකිරිණශීලීතා අයනීකරණය හෝ දූෂණය වීම

  ආ) ඕනෑම න්‍යෂ්ටික ස්ථාපනයක, ප්‍රතික්‍රියාකාරකයකින් හෝ වෙනත් න්‍යෂ්ටික එකලස් කිරීමක හෝ එහි න්‍යෂ්ටික සංරචකයක විකිරණශීලී, විෂ සහිත පපුරණ ද්‍රව්‍ය හෝ වෙනත් අන්තරායකර හෝ දූෂිත අන්තර්ගතය

  ඇ) පරමාණුක හෝ න්‍යෂ්ටික විකණ්ඩනය සහ/හෝ විලයනය හෝ ඒ හා සමාන ප්‍රතික්‍රියාවක් හෝ විකිරණශීලී බලයක් හෝ පදාර්ථයක් භාවිතා කරන ඕනෑම යුද අවියක්

*(වැඩි විස්තර සඳහා කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 01 සහ 02 බලන්න)*

**ආවරණය නොවන දේ (1 වෙනි කොටස - භෞතික හානි සඳහා විශේෂ ව්‍යතිරේක):**

- උපලේඛනයේ සඳහන් අඩු කරනු ලබන මුදල
- සොරකම නිසා සෘජුව හෝ වක්‍රව සිදුවන පාඩුව හෝ හානිය
- රක්ෂණ ඔප්පුව ආරම්භ වන අවස්ථාවේ පැවති සහ රක්ෂිතයා දැන සිටි ඕනෑම දෝශයක් හෝ දෝෂයක් නිසා සිදුවන පාඩුව හෝ හානිය
- ඕනෑම ගෑස්, ජලය හෝ විදුලි සැපයුමක අසාර්ථකත්වය හෝ බාධාව හේතුවෙන් සෘජුව හෝ වක්‍රව සිදුවන පාඩුව හෝ හානිය
- මෙහෙයුමේ අඛණ්ඩ බලපෑමේ (උදා: ගෙවීයාම, මළකඩකෑම) හෝ වායුගෝලීය තත්ත්වයන් හේතුවෙන් ක්‍රමයෙන් පිරිහීමේ ප්‍රතිඵලයක් වශයෙන් සිදුවන පාඩුව හෝ හානිය
- රක්ෂණය කර ඇති අයිතම්වලට අවිනිශ්චිත අලාභයක් හෝ හානියක් නිසා සිදුවී තිබුණහොත් මිස, ක්‍රියාකාරී අසාර්ථකත්වයන් ඉවත් කිරීම සඳහා දරන ලද පිරිවැය
- නඩත්තු කිරීමේදී හුවමාරුවන කොටස් ඇතුළුව රක්ෂණය කරන ලද අයිතමය නඩත්තු කිරීම සඳහා දරන ලද පිරිවැය
- නීතියෙන් හෝ කොන්ත්‍රාත්තුවක් යටතේ නිෂ්පාදකයා හෝ සැපයුම්කරු වගකිව යුතු පාඩුව හෝ හානිය
- නීතියෙන් හෝ බදු ගිවිසුමක් / නඩත්තු ගිවිසුමක් යටතේ හිමිකරු වගකිව යුතු කුලියට ගත් උපකරණ නැති වීම හෝ හානි වීම
- ඕනෑම ආකාරයක අනුශාංගික අලාභයක් හෝ වගකීමක්
- බල්බ, කපාට, රිබන්, ෆියුස්, සීල්, පටි, වයර්, දම්වැල්, රබර්, ටයර්, හුවමාරු කළ හැකි මෙවලම්, කැටයම් කළ සිලින්ඩර, වීදුරු, පෝසිලේන්, හෝ පිහන් මැටිවලින් සාදන ලද වස්තූන්, පෙරහන් හෝ රෙදිපිළි හෝ ඕනෑම මෙහෙයුම් මාධ්‍යයකට සිදුවන පාඩුව හෝ හානිය
- පින්තාරු කරන ලද, ඔප දැමූ හෝ එනැමල් කරන ලද මතුපිට සීරීම් වැනි සෞන්දර්යාත්මක දෝෂ

*(වැඩි විස්තර සඳහා කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 05 සහ 06 "ව්‍යතිරේක" කොටස බලන්න)*

**People's Insurance PLC,** No. 07, Havelock Road, P.O. Box 215, Colombo 05.
Tel: +94 11-2126 126 | Fax: +94 11-2126 109 | E-mail: pilassist@plc.lk | www.peoplesinsurance.lk
(A Subsidiary of People's Leasing & Finance PLC and People's Bank) - Company No. PB 3754 PQ



**ආවරණය නොවන දේ (2 වෙනි කොටස - බාහිර දත්ත මාධ්‍ය සඳහා විශේෂ ව්‍යතිරේක):**

- උපලේඛනයේ සඳහන් අඩු කරනු ලබන මුදල
- ව්‍යාජ ක්‍රමලේඛනය, සිදුරු කිරීම, ලේබල් කිරීම හෝ ඇතුලත් කිරීම, තොරතුරු නොදැනුවත්වම අවලංගු කිරීම හෝ දත්ත මාධ්‍ය ඉවත දැමීම සහ චුම්භක ක්ෂේත්‍ර නිසා ඇතිවන තොරතුරු නැතිවීම හේතුවෙන් ඇතිවන ඕනෑම පිරිවැයක්
- ඕනෑම ආකාරයක අනුශාංගික අලාභයක්

*(වැඩි විස්තර සඳහා කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 08 බලන්න)*

**ආවරණය නොවන දේ (3 වෙනි කොටස - වැඩ කිරීමේ පිරිවැය වැඩිවීම සඳහා විශේෂ ව්‍යතිරේක):**

- EDP උපකරණ ප්‍රතිසංස්කරණය කිරීම හෝ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය බලධාරීන් විසින් පනවා ඇති සීමාවන් හේතුවෙන් සිදුවන ඕනෑම අමතර වියදමක්
- ශානි වූ හෝ විනාශ වූ උපකරණ අළුත්වැඩියා කිරීමට හෝ ප්‍රතිස්ථාපනය කිරීමට අවශ්‍ය අරමුදල් රක්ෂිතයාට නොලැබීම

*(වැඩි විස්තර සඳහා කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 09 බලන්න)*

**වාරික ගෙවීමේ ක්‍රමය:**

ඔප්පුව සඳහා වාරිකය සහ ඉන් අනතුරුව කෙරෙන අලුත් කිරීමකදී (ඔප්පු උපලේඛනයේ වෙනත් ආකාරයකින් සඳහන් කර නොමැති නම්) වාර්ෂිකව ගෙවිය යුතුය.

**හිමිකම් ක්‍රියා පටිපාටිය සහ අවශ්‍ය ලියකියවිලි:**

- රක්ෂිතයා විසින් රක්ෂණ සමාගමට වන්දි ගෙවීමට හේතු විය හැකි ඕනෑම සිදුවීමක් පිළබඳව දුරකථනයෙන් සහ ලිඛිතව වහාම දැනුම් දිය යුතු අතර, එමගින් අලාභයේ හෝ හානියේ ස්වභාවය සහ ප්‍රමාණය පිළිබඳ ඇඟවීමක් ලබා දිය යුතුය.
- අලාභයේ හෝ හානියේ ප්‍රමාණය අවම කිරීම සඳහා රක්ෂිතයා සියලු සාධාරණ පියවර ගත යුතුය.
- රක්ෂිතයා විසින් බලපෑමට ලක් වූ කොටස් රක්ෂණ සමාගමේ නියෝජිතයෙක් හෝ තක්සේරුකරුවෙක් විසින් පරීක්ෂා කිරීම සඳහා ආරක්ෂා කළ යුතුය.
- රක්ෂණ සමාගමට අවශ්‍ය විය හැකි සියලුම තොරතුරු සහ ලේඛනගත සාක්ෂි රක්ෂිතයා විසින් සැපයිය යුතුය.
- සොරකමක් හේතුවෙන් අලාභයක් හෝ හානියක් සිදුවුවහොත් පොලීසියට දැනුම්දිය යුතුය.
- අලාභය හෝ හානිය සිදුවී දින 14 ක් ඇතුලත දැනුම්දීමක් නොලැබුණහොත්, රක්ෂණ සමාගම විසින් වගකියනු නොලැබේ.
- රක්ෂණ සමාගම වගකීම පිළිබඳව තීරණයක් ගැනීම කල් දැමීමට හෝ සම්පූර්ණ වාරිකය පියවන තෙක් හිමිකම් පෑමක් ගෙවීම කල් දැමිය හැකිය.

*(වැඩි විස්තර සඳහා කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 02 සහ 03 "ව්‍යතිරේක" කොටස බලන්න)*

**People's Insurance PLC,** No. 07, Havelock Road, P.O. Box 215, Colombo 05.
Tel: +94 11-2126 126 | Fax: +94 11-2126 109 | E-mail: pilassist@plc.lk | www.peoplesinsurance.lk
(A Subsidiary of People's Leasing & Finance PLC and People's Bank) - Company No. PB 3754 PQ



**වංචාව:**

රක්ෂිතයා විසින් සපයා ඇති යෝජනා පත්‍රයෙ හෝ ප්‍රකාශයේ කිසියම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් අසත්‍ය තොරතුරු සපයා ඇත්නම් හෝ කිසියම් හිමිකම් පෑමක් වංචනිකව හෝ සැලකිය යුතු ලෙස අතිශයෝක්තියෙන් දක්වා ඇත්නම්, රක්ෂණ ඔප්පුව අවලංගු වන අතර, රක්ෂණ සමාගම කිසිම ගෙවීමක් කිරීමට බැඳී නොමැත.

*(වැඩි විස්තර සඳහා කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 03 "ව්‍යතිරේක" කොටස බලන්න)*

**රක්ෂණ ඔප්පු හිමියාගේ වගකීම්:**

- අලාභය හෝ හානිය වැළැක්වීම සඳහා රක්ෂිතයා සියලු සාධාරණ පූර්වාරක්ෂක පියවර ගත යුතු අතර, ව්‍යවස්ථාපිත සහ නිෂ්පාදකයාගේ නිර්දේශයට අනුකූල විය යුතුය.
- රක්ෂිතයා විසින් අවදානමේ සිදුවන ඕනෑම සැලකිය යුතු වෙනසක් පිළිබඳව ලිඛිතව සහ දුරකථනය ඔස්සේ වහාම රක්ෂණ සමාගමට දැනුම්දිය යුතුය.
- රක්ෂණ සමාගමේ ලිඛිත තහවුරු කිරීමකින් තොරව අවදානම වැඩි කරන කිසිදු සැලකිය යුතු වෙනසක් සිදු නොකළ යුතුය.
- ඉල්ලීමක් කරනු ලැබුවහොත් රක්ෂිතයා අවදානම තක්සේරු කිරීම සඳහා අවශ්‍ය සියලු විස්තර සහ තොරතුරු සැපයිය යුතුය.
- ඔප්පු නියමයන් නිසි ලෙස පිළිපැදීම සහ ඉටු කිරීම සහ යෝජනා පත්‍රයේ ප්‍රකාශවල සත්‍යතාව රක්ෂණ සමාගමේ ඕනෑම වගකීමකට පූර්ව කොන්දේසියක් වේ.
- රක්ෂිතයා විසින් රක්ෂිත දේපළට සිදුවන පාඩුව හෝ හානිය වැළැක්වීමට හෝ අවම කිරීමට සියලු සාධාරණ පූර්වාරක්ෂක පියවර ගත යුතුය.
- හිමිකම් පෑමකදී නිවැරදි වන්දි මුදල ලබා ගැනීම සඳහා, රක්ෂිතයා දේපළ එහි වර්තමාන වෙළඳපල වටිනාකමට රක්ෂණය කර ඇති බවට සහතික විය යුතුය.

**ඔප්පු හිමියාගේ වගකීම්:**

**වැදගත් තොරතුරු හෙළිදරව් කිරීම පිළිබඳව ඔප්පු හිමියාගේ වගකීම**

- මිලදී ගන්නා අවස්ථාවේදී:- ඕනෑම හිමිකම් ප්‍රතික්ෂේප කිරීමක් වළක්වා ගැනීම සඳහා යෝජනාපත්‍රයේ ඉල්ලා ඇති සියලුම වැදගත් කරුණු සත්‍ය හා නිවැරදිව හෙළි කරන්න.

- ඔප්පු කාලසීමාවේදී:- අවදානම් හෝ පුද්ගලික තොරතුරුවල සිදුවන සැලකිය යුතු වෙනස්කම් පිළිබඳව රක්ෂණ සමාගමට දැනුම් දෙන්න.

*කරුණාකර ප්‍රතිපත්ති වචනවල ,කොන්දේසි, කොටස යටතේ පිටු අංක 04, කරුණු අංක 01 සහ පිටු අංක 02 කරුණු අංක 04 බලන්න*

**හිමිකම් පෑමක් කරන විට ඔප්පු හිමියාගේ වගකීම:-**

- හිමිකම් පෑමක් කරන විට:- හිමිකම් පෝරමය සමග හිමිකම් ක්‍රියා පටිපාටියේ සඳහන් කර ඇති පරිදි අවශ්‍ය සියලුම ලියකියවිලි සහ විස්තර සපයන්න.
- බොරාගත් දේවල්:- සම්බන්ධයෙන් සමාගමට ඇති අයිතසිවාසිකම්.
- වාරික ගෙවීම:- ඔප්පුවේ වාරික ගෙවීමේ ප්‍රතිඥාභාරයට අනුව විය යුතුය.

*කරුණාකර ප්‍රතිපත්ති වචනවල ,කොන්දේසි, කොටස යටතේ පිටු අංක 01, කරුණු අංක 01 සහ පිටු අංක 02 කරුණු අංක 04 බලන්න*

- රක්ෂිතයා විසින් රක්ෂණය කර ඇති දේපළට සිදුවන අලාභය හෝ හානිය වළක්වා ගැනීමට හෝ අවම කිරීමට සියලු සාධාරණ පූර්වාරක්ෂක කටයුතු ගත යුතුය.

- හිමිකම් පෑමකදී නිවැරදි වන්දි මුදල ලබා ගැනීම සඳහා, රක්ෂිතයා දේපල එහි වර්තමාන වෙළඳපල වටිනාකමට රක්ෂණය කර ඇති බවට සහතික විය යුතුය.

- හිමිකම් පෑමකදී නිවැරදි වන්දි මුදල ලබා ගැනීම සඳහා, රක්ෂිතයා විසින් අදාළ දේපළ එහි වෙළඳපොල වටිනාකමට රක්ෂණය කර ඇති බව සහතික කර ගත යුතුය.

**<u>පැමිණිලි පිළිබඳ ක්‍රියා පටිපාටිය:</u>**

අපි ඔබට සේවය කිරීමට කැපවී සිටින අතර ඔබගේ අදහස්/යෝජනා ලබාගැනීමට කැමැත්තෙන් සිටින්නෙමු. අපගේ සේවාවන් පිළිබඳව ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, ඔබට පහත ක්‍රම මගින් පැමිණිල්ලක් ඉදිරිපත් කල හැකිය:

- දුරකතනයෙන් - පාරිභෝගික සේවා නිලධාරි - 011 2126136
- ඊ-මේල් මගින් - pilassist@peoplesinsurance.lk
- වට්ස්ඇප් මගින් - 0716230048
- ෆැක්ස් මගින් - 011 2126109
- තැපැලෙන් - පාරිභෝගික සේවා නිලධාරි, පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී., අංක 07, හැව්ලොක් පාර, කොළඹ 05
- මාර්ගගත ක්‍රමය මගින් - පැමිණිලි ඉදිරිපත් කිරීමේ පෝරමය අපගේ වෙබ් අඩවියෙන් www.peoplesinsurance.lk ලබාගත හැකිය. කරුණාකර “පැමිණිලි” ටැබ් එක මත ක්ලික් කරන්න
- අපගේ ප්‍රධාන කාර්යාලය වෙත පැමිණීමෙන්

පැමිණිල්ලක ඉදිරිපත් කරන අවස්ථාවේදී පහත සඳහන් තොරතුරු ලබා දිය යුතුය:-

i. පැමිණිල්ල කෙටියෙන්
ii. ඔබගේ නම සහ ඔබ හා සම්බන්ධ විය හැකි තොරතුරු
iii. යොමුව: ඔප්පු අංකය / වාහන අංකය / හිමිකම් අංකය
iv. සනාථ කෙරෙන ඕනෑම ලියවිලි

පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටිය භාෂා ත්‍රිත්වයෙන්ම අපගේ www.peoplesinsurance.lk වෙබ් අඩවියෙන් භාගත කල හැකිය. කරුණාකර “පැමිණිලි” ටැබ් එක මත ක්ලික් කරන්න.

**<u>ආරවුල් විසඳීම:</u>**

ඉදිරිපත් කරන ලද පැමිණිල්ලක් සඳහා අප විසින් ලබා දී ඇති විසඳුම පිලිබඳව ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, පහත සඳහන් විකල්ප ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයන් භාවිතා කිරීමට ඔබට හැකියාවක් ඇත:

i. ඔබගේ ගැටළු පහත ලිපිනයට යොමු කරන්න:-

ශ්‍රී ලංකා රක්‍ෂණ ඔම්බුඩ්ස්මන්
නො 1
බෙතෙස්ඩා පෙදෙස
කොළඹ 05
info@insuranceombudsman.lk
011 2505542 / 011 250 5041

ii. බේරුම්කරණය:- ඔප්පුවේ බේරුම්කරණ වගන්තියට අනුව

iii. ඔබගේ ගැටළු පහත ලිපිනයට යොමු කරන්න:-

අධ්‍යක්‍ෂ විමර්ශන
ශ්‍රී ලංකා රක්‍ෂණ නියාමන කොමිෂන් සභාව
11 වෙනි මහල, නැගෙනහිර කුළුණ,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
කොළඹ 01
011 2396184-9 / 011 2335167
investigation@ircsl.gov.lk / info@ircsl.gov.lk

**මතක තබා ගත යුතු කරුණු කිහිපයක්**

**රක්‍ෂණය අවලංගු කිරීම:**

රක්ෂිතයාගේ ඉල්ලීම පරිදි මෙම රක්‍ෂණය ඕනෑම අවස්ථාවක අවසන් කල හැකි අතර, එවැනි අවස්ථාවකදී කිසිදු හිමිකම් පෑමක් කර නොතිබීමට යටත්ව, රක්‍ෂණ සමාගම විසින් ඔප්පුව ක්‍රියාත්මකව පැවති කාලය සඳහා සාමාන්‍ය කෙටි කාලීන අනුපාතයක් රඳවා ගනු ඇත. රක්ෂිතයාට දැනුම් දීමෙන් පසු රක්‍ෂණ සමාගමේ කැමැත්ත පරිදි ඕනෑම අවස්ථාවක මෙම රක්‍ෂණය අවලංගු කල හැකි අතර, එවැනි අවස්ථාවකදී අවලංගු කිරීමේ දින සිට කල් ඉකුත් නොවූ කාලය සඳහා ඉල්ලා සිටි විට වාරිකයෙන් සමානුපාතික කොටසක් ආපසු ගෙවීමට රක්‍ෂණ සමාගම බැඳී සිටී.

මෙම ඔප්පුවේ නියමයන් සහ කොන්දේසි නිසි ලෙස පිළිපැදීම සහ ඉටු කිරීම මෙම ඔප්පුව යටතේ ඕනෑම ගෙවීමක් කිරීමේ සමාගමෙහි ඕනෑම වගකීමකට පූර්ව කොන්දේසියක් වනු ඇත.

*කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 03, කරුණු අංක 11 යටතේ ,කොන්දේසි, කොටස බලන්න*

**වැදගත් සටහන්:**

රක්‍ෂණ සැලසුම් පිළිබඳ තොරතුරු ලේඛනය (IPID) හි අරමුණ වන්නේ මූලික ආවරණය සහ අමතර ආවරණවල (අදාල වේ නම්) සහ ඔප්පුවේ ප්‍රධාන ලක්‍ෂණ පිළිබඳ සාරාංශයක් ලබා දීම වන අතර එය ඔබගේ නිශ්චිත පුද්ගලික අවශ්‍යතාවන් සඳහා සකස් කරන ලද්දක් නොවන බව සලකන්න. මෙම රක්‍ෂණයට අදාල ඕනෑම ආකාරයක සියලු කාරණා (හිමිකම් පෑම්, නියමයන් සහ කොන්දේසි පිළිබඳ අර්ථකථන සහ නීතිමය කටයුතු වැනි එහෙත් ඒවාට පමණක් සීමා නොවූ) මෙම ලේඛනයෙහි අන්තර්ගතය අභිබවා බලපැවැත්වෙන මූලික රක්‍ෂණ ඔප්පුවේ නියමයන්, කොන්දේසි සහ ව්‍යතිරේක මගින් පාලනය වන බව කරුණාවෙන් සලකන්න.

**People's Insurance PLC,** No. 07, Havelock Road, P.O. Box 215, Colombo 05.
Tel: +94 11-2126 126 | Fax: +94 11-2126 109 | E-mail: pilassist@plc.lk | www.peoplesinsurance.lk
(A Subsidiary of People's Leasing & Finance PLC and People's Bank) - Company No. PB 3754 PQ

PEOPLE'S INSURANCE
EMPOWERING A RESILIENT NATION

**වැඩිදුර තොරතුරු සඳහා:**

ඔබට වැඩිදුර තොරතුරු අවශ්‍ය නම්, පහත සඳහන් මාර්ග ඔස්සේ එය ලබා ගත හැකිය:

- දුරකතනය - 0112126126
- ඊ-මේල් - pilassist@peoplesinsurance.lk
- දිවයින පුරා පිහිටි අපගේ ශාඛා කාර්යාලයන් වෙත පැමිණීමෙන්